# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2001 අංක 8 දරන
# දේශීය ආදායම් (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2001 ජූලි මස 24 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2001 ජූලි මස 27 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 12.50 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.25 යි.**

# 2001 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2001 ජූලි මස 24 වන දින]

එල්.ඩී.-ඕ. 23/2001.

## 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 2001 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තිය, ඒ වගන්තියේ (අ) ඡේදය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 2000 අංක 38 දරන පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) ඒ ඡේදයේ (lxxiii) අනුඡේදයේ, "ඉන්දු ශ්‍රී ලංකා පදනම ;", යන වචන වෙනුවට "ඉන්දු ශ්‍රී ලංකා පදනම ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ ඡේදයේ අගට පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් —

"(lxxiv) යුරෝපීය ආයෝජන බැංකුව ; ".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ, "ලෝක බැංකුව හෝ රතුකුරුස සංගමයේ අන්තර්ජාතික කමිටුව" යන වචන වෙනුවට "ලෝක බැංකුව, රතුකුරුස සංගමයේ අන්තර්ජාතික කමිටුව, ලෝක සංරක්ෂණ සංගමය හෝ යුරෝපීය ආයෝජන බැංකුව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ඒ වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අඅ) යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් කරගෙන යන හෝ ක්‍රියාත්මක කරන යම් වාසික සමාගමක් විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් කරගෙන යන හෝ ක්‍රියාත්මක කරන අතරතුර දී,

2—H 11684— 4,400 (2001/05)

2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් තුළ ශ්‍රී ලංකාවෙන් පිටත, (ඉදිකිරීමේ යෝජනා සම්බන්ධ සේවාවන් ඇතුළත් ව) ඉටු කරන ලද සේවාවන් සම්බන්ධයෙන් ඒ සමාගම විසින් හෝ හවුල් ව්‍යාපාරය විසින් හෝ ඒ තක්සේරු වර්ෂය තුළ, විදේශීය ව්‍යවහාර මුදලින් උපයන යම් ලාභ සහ ආදායම, (ශ්‍රී ලංකාවෙන් පිටත දී එම සමාගම හෝ හවුල් ව්‍යාපාරය විසින් දරන ලද යුක්තිසහගත වියදම් වශයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන මුදල් ප්‍රමාණයක් අඩු කිරීමෙන් පසුව) බැංකුවක් මගින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලැබිණි නම්, ඒ ලාභ සහ ආදායම ;''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ වගන්තිය ඇතුළත් කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය, ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :–

"යටිතල පහසුකම් සපයන ඇතැම් සමාගම්වල ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

18අ (1) 2001 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන් පසුව ව්‍යාපාර කටයුතු ආරම්භ කරන යම් සමාගමක් විසින් 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව, (2) වන උපවගන්තියේ සඳහන් යම් නිශ්චිත ව්‍යවසායකින් ලබන (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන යම් ලාභ හා ආදායම් නොවන) ලාභ සහ ආදායම, ඒ ව්‍යවසායේ ස්වභාවය සහ ඒ ව්‍යවසායෙහි කරනු ලබන ආයෝජනය සැලකිල්ලට ගෙන, නියෝග මගින් නියම කරනු ලැබිය හැකි, ඒ ව්‍යවසාය විසින් ව්‍යාපාර කරගෙන යාම ආරම්භ කරන තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට ගණන් බලන ලද, අවුරුදු විස්සක් නොඉක්මවන යම් කාලයක් සඳහා, ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන, යටිතල පහසුකමක් සංවර්ධනය කිරීම හෝ පවත්වාගෙන යාම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා වූ හෝ සංවර්ධනය කරන, පවත්වාගෙන යන හා ක්‍රියාත්මක කරන ව්‍යවසායක් කරගෙන යාමෙහි පමණක් යෙදී සිටින සමාගමක් වන, රටේ ආර්ථික සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය බවට, ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන, සමාගමකට අදාළ විය යුතු ය.

(3) මේ වගන්තියෙහි "යටිතල පහසුකම" යන්නෙන් ගුදමක්, ගබඩාවක්, කර්මාන්ත අංගනයක්, සෞඛ්‍යාරක්ෂක හෝ ඝන කසල කළමනාකරණ පද්ධතියක් හෝ විදුලි බලය, ජලය හෝ නාගරික නිවාස සම්පාදනය සඳහා වන ව්‍යාපෘතියක් අදහස් වේ .".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තිය ඇතුළත් කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :-

"හස්ත කර්මාන්ත භාණ්ඩ අපනයනය කිරීම පිණිස වූ යම් ව්‍යවසායක ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

20අ. (1) හස්ත කර්මාන්ත භාණ්ඩ සඳහා අපනයන වෙළෙඳපොළ දිරිගැන්වීමෙහි ලා ඇති අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වූ ද : සහ 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන පනත යටතේ පිහිටුවන ලද හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් නිශ්චය කොට දක්වන ලද යම් නිශ්පාදන ප්‍රමිතීන්ට අනුකූල වන්නා වූ ද, හස්ත කර්මාන්ත භාණ්ඩ අපනයනය කිරීම සඳහා වූ යම් ව්‍යවසායකින් වන 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු එහෙත් 2004 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ අපනයන ලාභ සහ ආදායම්වලින් සමන්විත වන ලාභ සහ ආදායම්වල කොටස ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) මේ වගන්තියෙහි -

තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් සහ තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් "අපනයන ලාභ සහ ආදායම්" යන්නෙන්, (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද ව්‍යවසායෙන් ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ ඒ තක්සේරු වර්ෂය සඳහා වූ (යම් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලත් ලාභ සහ ආදායම්

බැහැර කිරීමෙන් පසුව 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල) ලාභ සහ ආදායම, ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ ඒ තක්සේරු වර්ෂය සඳහා අපනයන පිරිවැටුම ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ ඒ තක්සේරු වර්ෂය සඳහා මුළු පිරිවැටුමට යම් අනුපාතයක් දරන්නේ ද එකී අපනයන ලාභ සහ ආදායම ඒ අනුපාතයම දරන මුදල අදහස් වේ ;

තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් සහ තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් "අපනයන පිරිවැටුම" යන්නෙන්, (යම් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණු හෝ ලැබිය හැකි යම් මුදලක් හැර) (1) වන උපවගන්තියේ සඳහන් වන යම් වර්ගවල සහ ප්‍රමිතීන්ට අනුකූල හස්ත කර්මාන්ත භාණ්ඩ අපනයනය කිරීමෙන් ඒ තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට ලැබුණු හෝ ලැබීමට හැකි මුළු මුදල අදහස් වේ ;

"හස්ත කර්මාන්ත" යන්නෙන්, සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් අතින් තනනු ලබන සැරසිලි වශයෙන් අගයක් ඇති භාණ්ඩයක් අදහස් වේ ;

තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් සහ තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට "මුළු පිරිවැටුම" යන්නෙන් (යම් ප්‍රාග්ධන වත්කමක් විකිණීමෙන් ලැබුණ හෝ ලැබිය හැකි යම් මුදලක් හැර) ඒ තක්සේරු වර්ෂයේ දී එම තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට ලැබුන හෝ ලැබිය හැකි මුළු මුදල අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තිය අගට පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

"(8) ශ්‍රී ලංකාවේ යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හෝ ශ්‍රී ලංකා පොලිස් සේවයේ සාමාජිකයන්ගේ සහ ඒ ඒ සාමාජිකයන්ගේ පවුල්වල ශුභසාධනය සඳහා යම් අරමුදලක් හෝ සමිතියක් ඇති කරන ලද හෝ පිහිටුවන ලද අවස්ථාවක ඒ අරමුදල හෝ සමිතිය විසින් ගෙවිය යුතු බද්ද අඩු කිරීම හෝ ලිහිල් කිරීම ඊට අදාළ සියලු අවස්ථාගත කරුණු අනුව සාධාරණ සහ යුක්ති සහගත බව කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නේ නම්, ඒ අරමුදල හෝ සමිතිය විසින් ගෙවිය යුතු බද්ද, ඔහු විසින් නියම කරනු ලබන යම් කොන්දේසි වලට යටත්ව, අඩු කිරීම හෝ ලිහිල් කිරීම කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබිය හැකි ය.";

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් :-

"සමාගම් නොවන තැනැත්තන් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් තක්සේරු වර්ෂයක දී" යන වචන වෙනුවට "2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (2) උපවගන්තියේ-

(අ) "(1) වන උපවගන්තියේ සඳහන්" යන වචන වෙනුවට "(1) වන උපවගන්තියේ සඳහන් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන" යන වචන ආදේශ කිරීමෙන් :

(ආ) එහි (අ) ඡේදයෙහි–

(i) "ආදායමේ අදාළ කොටස ඒ ලාභ සහ ආදායම ඉක්මවන්නේ නම්" යන වචන වෙනුවට, "ආදායමේ අදාළ කොටස ඒ පඩිනඩි සහ ගාස්තු ප්‍රමාණය ඉක්මවන්නේ නම්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) ඒ ඡේදයෙහි (1) වන අනුඡේදයෙහි "ඒ ලාභ සහ ආදායමට සමාන වන" යන වචන වෙනුවට "ඒ පඩිනඩි හා ගාස්තු ප්‍රමාණයට සමාන වන" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එහි (ආ) ඡේදයෙහි–

"ලාභ සහ ආදායම නොඉක්මවන්නේ නම්" යන වචන වෙනුවට "ඒ පඩිනඩි සහ ගාස්තු ප්‍රමාණය නොඉක්මවන්නේ නම්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තිය අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :–

"(3) (1) වන උපවගන්තියේ සඳහන් 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් පුද්ගලයකුගේ බදු අය කළ හැකි ආදායමට, ඒ පුද්ගලයා විසින් උපයන ලද ඒ උපවගන්තියේ සඳහන් යම් පඩිනඩි හා ගාස්තු හෝ (1) වන උපවගන්තියේ සඳහන් ශ්‍රී ලංකාවේ යම් හවුල් ව්‍යාපාරයකින් ලැබූ ලාභවල ඔහුගේ කොටස වශයෙන් ඔහුට උපචිත වූ ඉහත කී පඩිනඩි හා ගාස්තු කිසිවක් හෝ ඇතුළත් වන්නා වූ ද අවස්ථාවක (මෙහි මින් මතු මෙම වගන්තියේ "ආදායමේ අදාළ කොටස" යනුවෙන් සඳහන් කරනු ලබන) ආදායම් බද්ද ගෙවිය යුතු ආදායමේ කොටස සඳහා ගෙවිය යුතු ආදායම් බදු අනුප්‍රමාණය සියයට දහයක අනුප්‍රමාණය ඉක්මවන්නා වූ ද අවස්ථාවක, ආදායමේ අදාළ කොටස සම්බන්ධයෙන් පහත සඳහන් ආකාරයෙන් බදු ගණනය කළ යුතු ය :–

(අ) ආදායමේ අදාළ කොටස ඒ පඩිනඩි සහ ගාස්තු ප්‍රමාණය ඉක්මවන්නේ නම්-

(i) ඒ පඩිනඩි සහ ගාස්තුව ප්‍රමාණයට සමාන වන ආදායමේ අදාළ කොටස මත ගෙවිය යුතු බද්ද සියයට දහය බැගින් වූ අනුප්‍රමාණයක් විය යුතු ය ; තව ද

(ii) ආදායමේ අදාළ කොටසේ ශේෂය මත ගෙවිය යුතු බද්ද, මේ පනත යටතේ ඊට අදාළ කළ යුතු පරිදි වූ, සියයට දහයට වැඩි බදු අනුප්‍රමාණයන් අනුව ගණනය කරනු ලැබිය යුතු ය ; සහ

(ආ) ආදායමේ අදාළ කොටස පඩිනඩි සහ ගාස්තු ප්‍රමාණය නොඉක්මවන්නේ නම් ආදායමේ අදාළ කොටසේ මුළු ප්‍රමාණය මත ගෙවිය යුතු බද්ද, මේ පනතේ ඊට පටහැනිව කුමක් සඳහන් වුව ද, සියයට දහයක අනුප්‍රමාණයක් විය යුතු ය.''.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ දෙවන අතුරු විධානයේ "8 වන වගන්තියේ (අ) ඡේදයේ යටතේ" යන වචන හා ඉලක්කම් වෙනුවට "8 වන වගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "8 වන වගන්තියේ (අ) ඡේදයේ යටතේ" යන වචන හා ඉලක්කම් වෙනුවට "8 වන වගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 131 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

ප්‍රධාන ප්‍රඥප්තියේ 131 වන වගන්තිය සංශෝධනය කිරීම.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා –

"නිශ්චිත තැනැත්තා" යන්නෙන්–

(අ) 2000 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් වන විට, තමන් වෙනුවෙන් හෝ වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් වෙනුවෙන් හෝ වෙනත් යම් හවුල් ව්‍යාපාරයක් හෝ හවුල් ව්‍යාපාර වෙනුවෙන්,

(i) වෙනත් යම් තැනැත්තකුට හෝ වෙනත් යම් හවුල් ව්‍යාපාරයකට, එකතුව රුපියල් තිස් දහසකට නොඅඩු නිශ්චිත ගාස්තුවක් හෝ නිශ්චිත ගාස්තු ; හෝ

(ii) එකතුව රුපියල් දෙලක්ෂ පණස් දහසකට නොඅඩු නිශ්චිත ගාස්තු

ඒ තක්සේරු වර්ෂයේ දී ගෙවීමට හෝ බැර කිරීමට ඉඩ ඇත්තා වූ හෝ ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව ම වූ තක්සේරු වර්ෂයේ දී ගෙවා හෝ බැර කර ඇත්තා වූ යම් තැනැත්තෙක්, හවුල් ව්‍යාපාරයක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ ;

(ආ) 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට, තමන් වෙනුවෙන් හෝ වෙනත් යම් තැනැත්තකුට හෝ තැනැත්තන් වෙනුවෙන් හෝ වෙනත් යම් හවුල් ව්‍යාපාරයක් හෝ හවුල් ව්‍යාපාර වෙනුවෙන්, එකතුව රුපියල් එක් මිලියනයකට නොඅඩු නිශ්චිත ගාස්තු, ඒ තක්සේරු වර්ෂයේ දී ගෙවීමට හෝ බැර කිරීමට ඉඩ ඇත්තා වූ හෝ ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව ම වූ තක්සේරු වර්ෂයේ දී ගෙවා හෝ බැර කර ඇත්තා වූ යම් තැනැත්තෙක්, හවුල් ව්‍යාපාරයක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

"නිශ්චිත ගාස්තුව" යන්නෙන් –

(අ) 2000 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් වන විට, අවස්ථාවෝචිත පරිදි, යම් තැනැත්තකු විසින් හෝ යම් හවුල් ව්‍යාපාරයක යම් හවුල්කරුවකු විසින් හෝ කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නා වූ යම් ව්‍යාපාරයක්, වෘත්තියක්, රක්ෂාවක් හෝ වෙනත් යම් ස්වාධීන ස්වභාවයකින් යුත් කටයුත්තක් කරගෙන යාමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා විසින් හෝ ඒ හවුල් ව්‍යාපාරයේ යම් හවුල්කරුවකු විසින් හෝ ඉටු කරන ලද සේවා සඳහා ප්‍රතිඝ්ඨාව වශයෙන් යම් නිශ්චිත තැනැත්තකු විසින් ගෙවිය යුතු යම් මුදලක් අදහස් වන අතර, ඒ නිශ්චිත තැනැත්තා විසින් ගෙවිය යුතු යම් කොමිස් මුදලක්, තැරැව් ගාස්තුවක් හෝ ඒ සමාන ස්වභාවයක වූ වෙනත් මුදලක් ඊට ඇතුළත් වන මුත් ඒ නිශ්චිත තැනැත්තා යටතේ වූ සේවා නියුක්තියක් අතරතුර ඒ නිශ්චිත තැනැත්තාගේ යම් සේවා නියුක්තයකුට ගෙවිය යුතු යම් මුදලක් ඊට ඇතුළත් නොවේ ;

(ආ) 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට, අවස්ථාවෝචිත පරිදි යම් තැනැත්තකු විසින් හෝ යම් හවුල් ව්‍යාපාරයක් විසින් හෝ කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නා වූ යම් ව්‍යාපාරයක්, වෘත්තියක්, රක්ෂාවක් හෝ වෙනත් යම් ස්වාධීන ස්වභාවයකින් යුත් කටයුත්තක් කරගෙන යාමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා විසින් හෝ යම් හවුල් ව්‍යාපාරයක් විසින් හෝ ඉටුකරන ලද සේවා සඳහා ප්‍රතිඝ්ඨාව වශයෙන් යම් නිශ්චිත තැනැත්තකු විසින් ගෙවිය යුතු මුළු එකතුව රුපියල් එක්ලක්ෂ පණස් දහසකට අඩු නොවන යම් මුදලක් හෝ මුදල් අදහස් වන අතර, ඒ ඒ නිශ්චිත තැනැත්තා විසින් ගෙවිය යුතු යම් කොමිස් මුදලක්, තැරැව් ගාස්තුවක් හෝ ඒ සමාන ස්වාභාවයක වූ වෙනත් මුදලක් ඊට ඇතුළත් වන මුත්, ඒ නිශ්චිත තැනැත්තා යටතේ වූ සේවා නියුක්තියක් අතරතුර, ඒ නිශ්චිත තැනැත්තාගේ යම් සේවානියුක්තයකුට ගෙවිය යුතු යම් මුදලක් ඊට ඇතුළත් නොවේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 186 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 186 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(i) "අයිතිකරු" යන්නෙහි අර්ථකථනයේ, "බිම් බද්දකට හෝ වෙනත් වාර්ෂික ගාස්තුවකට යටත්ව ඒ ඉඩම වැඩිදියුණු කිරීම" යන වචන වෙනුවට "බිම් බද්දකට හෝ වෙනත් වාර්ෂික ගාස්තුවකට යටත්ව ඒ ඉඩම සහ එහි වැඩිදියුණු කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) "සුදුසුකම් ලබන බෙදාහැරීම" යන්නෙහි අර්ථකථනයේ (ආ) ඡේදයේ (ii) අනුඡේදයේ "8 වන වගන්තියේ (අ) ඡේද යටතේ" යන වචන හා ඉලක්කම් වෙනුවට "8 වන වගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 187 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 187 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :–

"(2අ) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ යම් ව්‍යාවසායක් විසින් ගෙවනු ලැබිය යුතු ආදායම් බද්දෙන්, ඒ ව්‍යවසායේ ලාභ සහ ආදායම් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක්, නිශ්චිත කාලසීමාවක් සඳහා නිදහස් කිරීම පිණිස විධිවිධාන සලසන ගිවිසුමකට, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ඒ ව්‍යවසාය සමග 2000 අප්‍රේල් මස 1 වන දිනට ප්‍රථම ඇතුළත් වී ඇත්තා වූ ද 2000 මාර්තු මස 31 වන දිනට ඒ නිශ්චිත කාලසීමාවෙන් යම් කොටසක් නොගෙවී ඉතිරිව ඇත්තා වූ ද අවස්ථාවක, (1) වන උපවගන්තියේ විධිවිධාන නිසා නොවී නම්, ආදායම් බද්දෙන් නිදහස් විය හැකිව තිබුණු, අවස්ථාවෝචිත පරිදි ඒ ව්‍යවසායේ ලාභ සහ ආදායම් සම්පූර්ණයෙන් හෝ එහි කොටස, එකී නිශ්චිත කාලසීමාවෙන් නොගෙවී ඉතිරිව ඇති කොටස සඳහා මේ පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය."; සහ

(2) ඒ වගන්තියේ 3 වන උපවගන්තියට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :–

"(3අ) 2000 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, පුද්ගලයකු විසින් ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉඉ) ඡේදයේ සඳහන් යම් ආයතනයකට, ඒ ඡේදයේ සඳහන් –

(අ) යම් ණය මුදලක මුල් මුදල ආපසු ගෙවීම වශයෙන් ; හෝ

(ආ) යම් කුලී සින්නක්කර ගිවිසුමක මාසික ගෙවීම් වශයෙන්

යම් මුදලක් ගෙවනු ලැබූ අවස්ථාවක (1) වන උපවගන්තියේ කුමක් සඳහන් ව තිබුණ ද, එහෙත් ඉහත කී ඡේදයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව, ඒ මුදල, 2000 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී, එකී පනත තවදුරටත් බලාත්මක පවතින්නාක් සේ, ඒ පුද්ගලයාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩුකරනු ලැබිය හැකි ය.".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය, ඒ උපලේඛනයේ III වන කොටසේ " පළමුවන රු. 500,000 බදු ගෙවිය යුතු ආදායම සම්බන්ධයෙන් කිසිවක් නැත " යන වචන හා ඉලක්කම් වෙනුවට "බදු ගෙවිය යුතු ආදායමේ පළමුවන රු. 500,000 සම්බන්ධයෙන් කිසිවක් නැත" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**16.** මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව සඳහන් යම් විධිවිධානයක, ඒ උපලේඛනයේ II වන තීරුවේ දැක්වෙන අනුරූප සටහනේ දැක්වෙන යම් වචන හෝ යෙදුම් ඇත්නම් ඒ වචන හා යෙදුම් වෙනුවට, ඒ උපලේඛනයේ III වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් වචන හෝ යෙදුම් ආදේශ කරනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තිය සඳහා පොදු සංශෝධනය.

## උපලේඛනය

| I වන තීරුව | II වන තීරුව | III වන තීරුව |
|---|---|---|
| II (1) | මේ පනතේ 15,17,18,19 හෝ 20 වගන්ති | මේ පනතේ 15,17,18,19,20 හෝ 21 වගන්ති |
| 14(2) | (xxii) සහ (xxiiඅ) උපවගන්ති | (xx), (xxii) සහ (xxiii) උපවගන්ති |
| 23(1)(ග) | පිහිටුවීමෙහි ලා | පිහිටුවීමෙහි හෝ ඇවර කිරීමෙහි ලා |
| 32(3)<br>32(3) (ආ) | ඒ ආදායමේ කොටසක් මත<br>ආදායමේ සම්පූර්ණ අදාල කොටස මත ගෙවිය යුතු බද්ද | ඒ ආදායමේ කොටසක් මත<br>ආදායමේ ඒ කොටස මත ගෙවිය යුතු බද්ද |
| 49(1) (අ) | යම් වෙළෙඳ ද්‍රව්‍යයක් | යම් වෙළෙඳ ද්‍රව්‍යයක් |
| 61 (1) | නිල ලැයිස්තුගත පොදු සමාගමක් නොවන සෑම වාසික සමාගමකටම | සෑම වාසික සමාගමකටම |
| 76 (2) | ඒ ව්‍යාපාරයේ ලාභ සම්බන්ධයෙන් | ඒ ව්‍යාපාරයේ ලාභ සම්බන්ධයෙන් |
| 76 (2) | නිර්වාසික තැනැත්තාගේ අනුයෝජිතයා වූවාක් මෙන් | නිර්වාසික තැනැත්තාගේ අනුයෝජිතයා වූවාක් මෙන් |
| 76 (3) | නිර්වාසික තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් පිල්ලරව විකුණනු ලැබූ | නිර්වාසික තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් රඳවා තබාගනු ලැබූ |
| 86 (2) | වාරමුදල් නොවන යම් ආදායම් හෝ ලාභ | වාරමුදල් නොවන යම් ආදායම් හෝ ලාභ |
| 92 (3) | 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 82 වන වගන්තියේ සහ මේ පනතේ 92 වන වගන්තියේ | 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 82 වන වගන්තියේ |
| 104(1) (අ) | 98 වන වගන්තියේ (1) වන උපවගන්තිය | 98 වන වගන්තියේ (2) වන උපවගන්තිය |
| 104(1) (ආ) | 98 වන වගන්තියේ (2) වන උපවගන්තිය | 98 වන වගන්තියේ (1) වන උපවගන්තිය |
| 104(1) (ඇ) | iii වන වගන්තියේ යම් නියමයක් | III වන වගන්තියේ යම් නියමයක් |
| 105(1) | කිසිම තක්සේරුවක් කරනු ලැබ නොතිබුණ ද | කිසිම තක්සේරුවක් කරනු ලැබ නොතිබුණ ද |
| 117(3) | යම් ගෙවීම් කාලසීමාවක් | යම් ගෙවීම් කාලසීමාවක් |
| 171(6) | 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය | 113 වන වගන්තියේ (1) වන උපවගන්තිය |

**17.** 1999 අංක 41 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතේ 2 වන වගන්තියෙන් (පොදුරාජ්‍ය මණ්ඩලීය සංවර්ධන සංස්ථාව ආදායම් බද්දෙන් නිදහස් කරමින්) සංශෝධිත පරිදි වූ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තිය, 1996 ජනවාරි මස 01 දින දී බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

1979 අංක 28 දරන පනත සංශෝධනය කිරීම.

**18.** ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ යම් ව්‍යවසායක් සමග 2000 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන් පසුව එහෙත් මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ගිවිසුමකට ඇතුළත් වී ඇත්තා වූ ද ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ ගෙවිය යුතු ආදායම් බද්දෙන් ඒ ව්‍යවසායේ ලාභ හා ආදායම සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් නිදහස් කිරීම සඳහා ඒ ගිවිසුමෙන් විධිවිධාන සළසා ඇත්තා වූ ද අවස්ථාවක, ඒ නිදහස් කිරීම ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධානයක් මගින් ඒ ව්‍යවසායට ප්‍රකාශිතව ප්‍රදානය කර තිබුණාක් මෙන්, ඒ ගිවිසුමේ දින සිට වලංගුව හා බලසහිතව පැවති ඇති ලෙස සහ වලංගු හා බලසහිත ලෙස සලකනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඇතුළත් වූ ගිවිසුම්වල ඇතැම් නිදහස් කිරීම් වලංගු කිරීම.

**19.** මේ පනතේ 10, 11 සහ 13 වන වගන්තිවලින් ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධන, 2000 අප්‍රේල් මස 01 දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

අතීතයට බලපෑම.

**20.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.